# "මුතුහර ඔබයි අපයි ලොවයි" ඔස්සේ සමාජය දෙස බැල්මක්

**සජිත් ජයසුන්දර**

අප්‍රේල් මස 3 ඉරු දින මෙල්බර්න් රූපවාහිනී මුතුහර සමාජය සංවිධානය කළ "මුතුහර ඔබයි අපයි ලොවයි" ප්‍රසංගය නැරඹීමෙන් පසුව මගේ සිතට ආ අදහස් කීපයක් මෙසේ සටහන් කරන්නට සිතුවෙමි. මගේ අරමුණ මේ ඔස්සේ මෙය කියවන අයට සිතන්නට යමක් ලබා දීමයි.

මා දන්නා පරිද්දෙන් මුතුහර 1982 සිට මේ දක්වා සාර්ථකව අඛණ්ඩව පවත්වා ගෙන යන එකම රූපවාහිනී ළමා වැඩසටහන වන අතර එකම ළමා සමාජය ජාලයද වෙයි.

මෙම ප්‍රසංගය මුතුහර දරුවන්ට පමණක් වෙන් නොවී, "මුතුහර ඔබයි අපයි ලොවයි" අරුත් ගැන්වෙන පරිදී, හුදෙක්ම "දරුවා" යන සංකල්පය අභිමුඛයේ නිර්මාණය වූ ප්‍රසංගයක් ලෙස මට හැඟෙයි. එනිසා, කොහේ සිටියත් දරුවා දරුවාමයි සිතා, මේ ප්‍රසංගය ස්ථර කිහිපයක්ම නියෝජනය කළබව පෙනී යයි. ඒ, ශ්‍රී ලාංකික දරුවන්, ශ්‍රී ලාංකික සම්භවයක් ඇති මෙරට වාසී දරුවන්, ඔසී ජාතික දරුවන්, මුතුහර දරුවන්, මුතුහර නොවන මෙල්බර්න් වාසී අපේ දරුවන් යනාදී වශයෙනි. මේ අය අතරට තාල අසපුවත්, අමා නර්තන පාසලත් එක්ව සිටි බව අපට පෙනුණි.

මුතුහර මෙල්බර්න් ඇරඹූ දා පටන් එහි සංවිධායක වරිය වන වත්සලා ඉෂ්ඨවීර මහත්මිය බොහෝ අයගෙන් උපකාර ඉල්ලා සිටි බව රහසක් නොවේ. මේ ප්‍රසංගයටත් ඇය ඒ ආකාරයටම ආධාර ඉල්ලා සිටි බව අපට දැනගන්නට ලැබුණි. බොහෝ දෙනෙකුට මෙය කළ නොහැකි දෙයක් ලෙස පෙනුණ අතර සමහරෙක් දෙපයෙන් අඩිද්දී, සමහර හොඳ හිත ඇත්තන්, ඇත්තියන් ඇය ධෛර්යමත් කළ බවද අපි දනිමු.

මුදලට යට වුණු ජන සමාජයක එවන් දේව සිත් ඇත්තන් තවමත් නිහඬව ඉතිරිවී සිටීම අපේ දූ දරුවන්ගේ වාසනාව විය හැකියි. එවන් පියවරුන් මව්වරුන් මෙන්ම මව් පිය පදවි ලබන්නට බලා සිටිනවුන් අවංකවම මුතුහර ඔබයි අපයි ලොවයි එකට එක් කළා කියා කීවොත් නිවැදරදිය. නාලක වීරකෝන්, වසනා වීරකෝන්, චලංක අතලගේ, සහන් වීරසේකෙර, සුපින් බණ්ඩාර වැන්නවුන් ඒ අතර සිටින බව මේ ලිපිය ලියන්නට කරුණු සොයද්දී ඉෂ්ඨවීර මහත්මිය පැවසුවාය.







මෙතෙක්, මෙල්බර්න් ඉතිහාසයේ ශ්‍රී ලාංකීය දූ දරුවන් මෙන්ම මෙරට සුදු ජාතික දූ දරුවන් ද එකම තලයක එකම වේදිකාවක හිඳුවා, අපේ දේ අපට මෙන්ම ලෝකයාටත් එක ලෙස රස විඳීමට හැකි බව පසක් කර දුන්, මෙවන් ප්‍රමිතියක ප්‍රසංගයක් නොතිබුණා යයි මට සිතෙයි. මේ දරුවන්ගේ ප්‍රසංගය නැරඹීමට ශ්‍රී ලංකීය ප්‍රේක්ෂකයින් මෙන්ම මෙරට සුදු ජාතික ප්‍රේක්ෂක පිරිසකුත් එක් වීම අපේ සතුටට හේතුවක් විය. ප්‍රසංගයෙන් පසු නරඹන්නන් ලබා දුන් ප්‍රතිචර ඉතා ඉහළ මට්ටමක විය. ප්‍රසංගය අති සාර්ථක බව මේ ප්‍රතිචාර පෙන්වා දුන්බව සඳහන් කරන්නේ අපට ඔවුන් සමග එකඟ වන නිසාය.

මේ ප්‍රසංගය සංවිධානය කිරීමේදී ඉෂ්ඨවීර මහත්මිය මුහුණ දුන් අභියෝග අපමණ බව අපට දැනගන්නට ලැබුණි. මේ ගැන ඇය කීවේ මෙසේය.

"බොහෝ සමාජ මාධ්‍ය ආයතන මෙම ප්‍රසංගය ගැන කතා කරන්න ආරාධනා කළා, ඒ සඳහා අවස්ථා ලබා දුන්නා. හැකි පමණින් අපත් ඒ සඳහා කාලය ගත්තා. අපි විශේෂයෙන් ගුවන්විදුලි ආයතන දෙකකින් සුළු අවස්ථාවක් ඉල්ලුවා. ඉන් එකකින් අපට ලැබුණෙ දරුවන්ව අඩු තක්සේරුවක් කරන අධෛර්යමත්

"ප්‍රවේශ පත් අලෙවියේදී පවා අපට ලැබුණෙ අධෛර්යමත් කරන අත්දැකීම්. දරුවන් වෙනුවෙන් කෙරෙන යමකට මෙයිට වඩා සහයෝගයක් ලැබිය යුතුයි කියලා මට හිතෙනවා. මොනවා උනත් ශාලාව දරුවන්ගෙන් සහ වැඩිහිටි අයගෙන් පිරිලා තිබුණා. ඒ, මුතුහර දෙමව්පියන්ගේ උත්සාහයේ ප්‍රතිඵලයක්. බොහෝ දෙනෙක් මුතුහර ඔබයි අපයි ලොවයි තමන්ගේ ම දරුවාගේ ප්‍රසංගයක් ලෙස සිතා බොහෝ වෙහෙස වුණා. ප්‍රසංගයේ හැම දේටම තිබුනේ ඉතා සුළු කාලයයි. මේ නිසා, මෙහි ප්‍රචාරක කටයුතු වැඩි ප්‍රමාණයක් කළේ මුතුහර දරුවනුත් දෙමාපියනුත් තමයි. ප්‍රසංගය බලන්න ආ බොහෝ දෙනෙක් පුද්ගලික දැන හැඳුනුම් කම් මත ආ අය. දරුවන්ගේ දේ අගයන, එහි වැදගත් කම දන්නා හඳුනන අය දුර කතර ගෙවා ගෙන මෙය බලන්න ආවා, සිඩ්නි නුවරින් පවා. එය අගය කළ යුත්තක්. සමහර අයට ප්‍රවේශ පතේ මිලත් ගැටළුවක් වුණා. වැඩිහිටි බොහෝ අය සති අන්ත වල දී dinner dance" එතකොට පස් හය වතාවක් එන යන ප්‍රසිද්ධ කලාකරුවන්ගේ ප්‍රසංග බලන්න මොන තරම් මුදලුත් කාලයත් වියදම් කරනවද? නමුත් දරුවන් වෙනුවෙන් පුංචිම පුංචි කාලයක් හෝ මුදලක් වියදම් කරන්න අපි

ප්‍රතිචාරයක්. මෙවැනි පරිසරයක, මෙවැනි රටක හැදෙන වැඩෙන අපේම දරුවන්ට අපේම වැඩිහිටි දෙමව්පියෝ මෙවැනි පසුගාමී වදන් පාවිච්චි කිරීම ගැන මම මොහොතක් නිහඬව සිතා බලා ඔවුන්ට ස්තුති කර නිහඬ වුණා. අපේම අතු රිකිලි කපා දමන්නේ අපිම නේද?" ඇය කීවේ ඉතා වේදනාවෙන්.

ඒ අතරේ ඉතාම පසුගාමී අදහස් දැක්වූ අයද සිටි බව ඇය සඳහන් කළාය. "නැවත නොලැබෙන මුදල්, කිසි වැඩක් නැහැ. අපිට අනෙක ඕවට වේලාව නැහැ" වැනි අධෛර්යමත් කරවන අදහස් මැද මේ ප්‍රසංගය මේසා සාර්ථක එකක් බවට පත් කරන්නට අනුශාසකවරියට හැකිවීම ජයග්‍රහණයක්ම විය.

ඒ අතර මුතුහරට කිසිසේත් සම්බන්ධයක් නැති බාහිර සමාජයේ මහත්ම ගති ඇත්තෝ කිහිප දෙනෙක් කිසිම ලෝභයක් නැතුව මේ කර්තව්‍යට පිහිට වූහ. ඔවුන්ට දුර, කාලය හෝ අවිවේකි බව නම් මොහොතකටවත් දැනෙන්නට නැතුව ඇති. මාස 2 ක් ඔවුන් ස්වේච්ඡාවෙන් දිවා රෑ නොබලා මේ දුෂ්කර කටයුත්තට උර දුන් ආකාරය ප්‍රශංසනීයය.

බොහෝ දෙනෙක් පැකිළෙනවා. ඒකයි ඇත්ත. වේදිකාවේ ඉන්නේ තමන් සමග අමනාප වූ කෙනෙක්ගේ දරුවෙක් නම්, ඒ නිසාම මේ ප්‍රසංගය නො බලපු ඇත්තොත් මේ අතර සිටියා. දරුවන් ඉදිරියේ වැඩිහිටි අපි කොයි තරම් පුංචි ද?

මේ තත්වය පිළිබඳව අප වත්සලා ඉෂ්ඨවීර මහත්මියගෙන් ඇසූ විට ඇය කීවේ මෙවන් අදහසකි.

"මේ කටයුත්තේදී මුල සිටම මා ළමයි ගැන අපරිමිත විශ්වාසයක් තැබුවා. දරුවන්ගේ හිත පිරිසුදුයි, අහිංසකයි. මවකට ඕනෑම දරුවෙක් තමන්ගේ දරුවා යැයි සිතිය හැකිනම් ඒ තමයි නියම ආදරය. මුතුහර නිර්මාතෘ ආචාර්ය ලලිතා සිරිබද්දන මෑණියන් අතින් කොතරම් දරුවන් බිහි වුනාද? මෙල්බර්න් මුතුහර කියන්නෙත් ඒ අඩි පාරේ යන තවත් මුතුහර සමාජයක් විය යුතුයි. සෑම දරුවෙක්ම දක්ෂයෙක්, මම සොයන්නෙත් ඒ සැඟවුණු දක්ෂයෝයි. එයයි අපේ අරමුණ එතනදී මට මගේ දරුවත් ඔබේ දරුවත් එක් කෙනෙක් විනා දෙදෙනෙක් නොවෙයි."

සමහර අය මේ ප්‍රසංගය දුටුවේ අපූරු ධන ලාභයක් විදිහට. ළමයි.. දක්ෂ ළමයි. ඒ කියන්නේ මුදල්. ළමයි කියන්නෙ හොඳ උල්පතක්. ඒ සමහරක් අය මේ ප්‍රයත්නය දුටුව දෘෂ්ඨිකෝණය.

ඒ ගැන දැනෙන්නේ දුකක්. ඒ වගේම බියක්. ලංකාවේ සිට පැමිණ මේ ප්‍රසංගයට දායක වුණු මුතුහර සොයාගත් දක්ෂ දරුවන් දෙදෙනා දිහා ඇතැමුන් බැලුවෙත් මේ විදිහට. ඉදිරියේදී ඒ දරුවන් දෙදෙනාගේ අනාගතයත් මුදලට උඩ යට යන තරාදියක් වේවි කියලා මට හිතෙනවා. දරුවන්ගේ දක්ෂතාවන්ට නිසි වේදිකාවක් සුරක්ෂිතව තනා දීම වැඩිහිට අප අතින් විය යුත්තක්. විශේෂයෙන්ම අද පවතින තරගකාරී සමාජය තුළ" ඉෂ්ඨවීර මහත්මිය කියා සිටියා.

"බොහෝ විට, යම් දරුවෙක් යම් වරදක් කළහොත් අපි කියනවා, "අනේ තාම පොඩි එකනේ, ඔය නොතේරුම් කමට නේ" කියලා. එතකොට වැඩිහිටි අය අතින් කෙරෙන වැරදි ගැන අපි මොනවද කියන්නේ? මුතුහර තුළදී මම නිතරම දකින දෙයක් මේක. මෙතනදී, දරුවෝ කිසිම භේදයක් නැහැ. ඒත් සමහර වැඩිහිටි අය විරසකයි. සමහර අය අහිංසක ළමා හිත් වලටත් විෂ පොවනවා. සිංහල ජාතිය පිරිහෙන තැන මෙතන නෙමේද? තවත් සමහර අයට දේශපාලන පසුබිම, මිල අධික ගේ දොර වතුපිටි, උසස්

සාමාජ තත්වයන්, තානාන්තර නොමැතිව මෙවැනි ස්වේච්ඡාවෙන් කරන සමාජ කටයුතු දිහා බැලුවෙම වපර ඇහින්. මෙවැනි කටයුතු සඳහා කිසිම වේතනයක් නොලැබුනත්, දරුවන් සමග මෙසේ කටයුතු කිරීමෙන්, අන් කිසිවෙකුට නෙලා ගත නොහැකි වූ සතුටක් මා නෙලා ගත්තා. සමහර අය හිතනවා මං මේ කටයුත්ත කරන්නෙ පුද්ගලික ලාබයක් ලබාගන්නයි කියලා. සමහර ඇත්තෝ, මෙය නවත්වා ගේ දොර බලා ගෙන ඉන්න යැයි මට පවසා ඇති වාර ගණනකි. ඔවුන් එසේ පවසන්නේ හුදෙක්ම මා ගැන අනුකම්පාවෙන් වෙන්න ඇති. ඒත් නුවණ, ඇතුන් ලවා වත් ඇද්දිය නොහැකි නිසා වෙන්න ඇති තවමත් මුතුහර මෙල්බර්න් රැක ගන්නට කැක්කුමෙන් මා මේ දඟලන්නේ"

"මේ කටයුත්තේදී මුල සිටම මා ළමයි ගැන අපරිමිත විශ්වාසයක් තැබුවා. දරුවන්ගේ හිත පිරිසුදුයි, අහිංසකයි. මවකට ඕනෑම දරුවෙක් තමන්ගේ දරුවා යැයි සිතිය හැකිනම් ඒ තමයි නියම ආදරය. මුතුහර නිර්මාතෘ ආචාර්ය ලලිතා සිරිබද්දන මෑණියන් අතින් කොතරම් දරුවන් බිහි වුනාද? මෙල්බර්න් මුතුහර කියන්නෙත් ඒ අඩි පාරේ යන තවත් මුතුහර සමාජයක් විය යුතුයි. සෑම දරුවෙක්ම දක්ෂයෙක්, මම සොයන්නෙත් ඒ සැඟවුණු දක්ෂයෝයි. එයයි අපේ අරමුණ එතනදී මට මගේ දරුවත් ඔබේ දරුවත් එක් කෙනෙක් විනා දෙදෙනෙක් නොවෙයි."

ඔබ වැන්නවුන්ගේ දෙඇස් දෙකන් මෙවැනි දේවල් ඉදිරියේ නිරතුරුවම විවරව තියන බව මගේ විශ්වාසයයි. මෙම ප්‍රසංගයේ මූලික සැලසුම් වලදී මග හැරිය අයවලුන් පවා ප්‍රසංගයේ අවසානයේ එහි සාර්ථකත්වය දුටු තැන පෙර නොවූ දැඩි ලෙන්ගතුකමින් මුතුහරේ ඉදිරිය ගැන සැලසුම් යොදා ගන්නට වෙනත් බලධාරීන් ඉදිරියේ අපූරුවට ඉදිරිපත් වූ ආකාරය පිළිබඳවද දැනගන්නට ලැබුණි.

"හැමදාම මම විශ්වාස කරන එක දෙයක් තියෙනවා. හොඳ හිතින් නිවැරදිව යමක් කරනවා නම් කවදාවත් වරදින්නේ නැහැ. මුතුහර කියන්නේ අවුරුදු 30කට වඩා වැඩි කාලයක් අඛණ්ඩව පවත්වාගෙන ආ ළමා සමාජයක් මෙල්බන් මුතුහර තාම ළදරුවෙක් මෙය ඉදිරියට ගකගත යුතුයි ඒ ඔබෙත් මගෙත් දරුවන් වෙනුවෙන් විනා වැඩිහිටි අප වෙනුවෙන් නොවෙයි" ඉෂ්ඨවීර මහත්මිය වැඩිදුරටත් කියා සිටියාය.

මෙවන් සාර්ථක ප්‍රසංගයක් පවත්වන්නට හැකි වූ මුතුහර ළමා සමාජයට ආඩම්බර විය හැකි බොහෝ ප්‍රතිචාර ද විය. මේ එක් නරඹන්නෙක් තබාගිය සටහනක්.

"ළමයින්ගේ ලෝකය සුන්දරයි
පුංචි පැන්චියන් අතර තරගයක් නැහැ
පුංචි පැන්චියන් අතර ලොකුකම් නැහැ
පුංචි පැන්චියන් අතර කේලම් නැහැ
පුංචි පැන්චියන් අතර හිතේ කහට නැහැ
පුංචි පැන්චියන් අතර කැපිලි නැහැ
අනෙක් ඇත්තෝ දැනගෙන උගනිත්වා"

මේ කතාවම අපට හොඳ පාඩමක් කියා මට සිතෙයි.